" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "
# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

SLSI ISO 9001 SYSTEM CERTIFIED
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
සාමාන්‍ය දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone } 011 - 2093000

මගේ අංකය / எனது இலக்கம் / My No. } CSWP/ADM/18-38/FI/05(A)
ඔබේ අංකය / உமது இலக்கம் / Your No. }
දිනය / திகதி / Date } 2021.10.

පාලන චක්‍රලේඛ ලිපි අංක : 02/2021

ආණ්ඩුකාර ලේකම්,ආණ්ඩුකාරවර කාර්යාලය(බ.ප.)
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය (බ.ප.),
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්,ආදායම් දෙපාර්තමේන්තුව(බ.ප.),
ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.),
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරි,

<u>මධ්‍යම රජය විසින් ආණ්ඩුකාරවරුන් හා පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගේ අනුදැනුමක් නොමැතිව පළාත් සභාවේ නිලධාරීන් කැඳවීම හේතුවෙන් රාජකාරිමය ගැටළු ඇතිවීම සම්බන්ධවයි</u>

සියළුම පළාත් ආණ්ඩුකාරවරුන්ගේ ප්‍රධානත්වයෙන් හා සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගේ, පළාත් ආණ්ඩුකාර ලේකම්වරුන්ගේ සහාගිත්වයෙන් 2020.08.31 වන දින පවත්වන ලද පළාත් ආණ්ඩුකාර සංසද සාකච්ජාවේදී ගනු ලැබූ තිරණය ප්‍රකාරව පළාත් සභාවේ නිලධාරීන් කැඳවීමේදී පළාතේ ආණ්ඩුකාරවරුන් හා ප්‍රධාන ලේකම් මගින් එම කැඳවීම් සිදු කරන ලෙසට රේඛීය අමාත්‍යාංශයන්හි සියළුම ලේකම්වරුන් හා රේඛීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් දැනුවත් කරන ලෙසට ඉල්ලීමක් සහිත ලිපියක් පළාත් ආණ්ඩුකාරවරුන්ගේ සංසදයේ කැඳවුම්කරු ලෙස බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අත්සනින් යුතුව ජනාධිපති ලේකම් හා අග්‍රාමාත්‍ය ලේකම් වෙත 2020.11.12 දින යොමු කර ඇත.

02. ඒ අනුව සාකච්ජාවන් සඳහා පළාත් සභා නිලධාරීන් කැඳවීමේදී නිසි ධූරාවලිය අනුගමනය කරන ලෙසත්, අදාල කැඳවීම් පිළිබඳ ගරු ආණ්ඩුකාරවරුන් හා පළාත් ප්‍රධාන ලේකම්වරුන් දැනුවත් කර ඔවුන්ගේ අනුමැතිය සහිතව අදාල නිලධාරීන් සහභාගි කර ගැනීමට කටයුතු කරන ලෙසත් දන්වමින් සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් අමතා ජනාධිපති ලේකම් විසින් අංක PS/CSA/00/9/13/99 හා 2021.01.18 දිනැති ලිපිය නිකුත් කර ඇත. (අදාල ලිපියේ පිටපතක් අමුණා ඇත.)

03. එසේ තිබියදීත් තවදුරටත් පළාත් සභාවේ සම්බන්ධීකරණයක් නොමැතිව පළාත් සභාවේ විෂයන් සම්බන්ධයෙන් කටයුතු කරන බවත්,පෙර පරිදිම ආණ්ඩුකාරවරුන්ගේ හෝ ප්‍රධාන ලේකම්වරුන්ගේ අනුදැනුමකින් තොරව පළාත් සභාවේ නිලධාරීන් කැඳවන බවත් 2021.09.22 දින පැවති ආණ්ඩුකාර සංසදයේදී ද කරුණු ඉදිරිපත් කර ඇත.

03. එබැවින් ජනාධිපති ලේකම් විසින් නිකුත් කර ඇති ලිපිය සම්බන්ධයෙන් ද අවධානය යොමු කරමින්, පළාත් ආණ්ඩුකාරතුමා හෝ ප්‍රධාන ලේකම් මගින් යොමු කරනු ලබන මධ්‍යම රජය විසින් පවත්වනු ලබන සාකච්ජා/රැස්වීම්/වැඩමුළු සඳහා පමණක් සහභාගි වන ලෙසත්, ඒ පිළිබඳව ඔබ අමාත්‍යාංශය / දෙපාර්තමේන්තු හා ඒ යටතේ පවතින ආයතන ප්‍රධානීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව දන්වමි.

ජේ.එම්.සී.ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත